# ලංකාවේ සන්ධාන ඉතිහාසය...3

සමසමාජ නායකයන්ට ඇමැති පදවි පිරිනමා රජය තුළට බඳවා ගැනීම ශ්‍රී.ල.නි.ප. සමහර ප්‍රබලයන්ගේ සිත් රිදවන්නක් වූවේය. පුවත්පත් ඒකාධිකාරියට එරෙහිව පියවර ගැනීම, පාසල් පොත් රජයෙන් මුද්‍රණය කර පාසල් සිසුන්ට පහසු මිලට ලබාදීම, හොර සුරා මැඩ පැවැත්වීම සඳහා පොල් ගසක් රා සඳහා මැදගැනීමට අවසර දීම නිසා විවිධ පාර්ශ්ව ඒකරාශීව සභාග රජයට විරුද්ධව ජනමතයක් ඇති කළහ.

1964 දෙසැම්බර් 03 වැනිදා මැතිසබයේ දී රජය එක ඡන්දයකින් පරාජයට පත්වීම නිසා 1965 මාර්තු 22 වැනිදාට අලුතින් මැතිවරණයක් පැවැත්වීමට සිදුවිය. මේ සඳහා මුහුණ දීමේදී ශ්‍රී.ල.නි.ප-සමසමාජ- කොමියුනිස්ට්- යන පක්ෂ සන්ධානයක් ලෙස කටයුතු කළ අතර "තුන් හවුල" නමින් ජනයා අතර හැඳින්වීමට ලක් විය. රජය පරාජය කළ කණ්ඩායම හැඳින්වූවේ "හත් හවුල" නමිනි.

මෙම සන්ධානය වැඩි ආසන ගණනක් දිනාගැනීම නිසා ඩඩ්ලි සේනානායක මහතාගේ නායකත්වයෙන් රජයක් පිහිටුවා ගන්නා ලදී. හවුල්කාර පක්ෂ හතටම ඇමැතිධුර පිරිනැමිණි. විවිධ ප්‍රතිපත්ති අනුගමනය කරන ප්‍රතිවිරුද්ධ මතධාරීන් රැසක් සමග සම්පූර්ණ නිලකාලය ගෙවා ගැනීමට එම සංධානයට හැකි වූවේ ඩඩ්ලි සේනානායක මහත්මාගේ අවංක හා පරිත්‍යාගශීලි ගුණගරුක බව නිසාය.

මේ ආණ්ඩුවේ වසර පහ ගතවිය.

මේ 1970 වසරයි. තුන් හවුල ලෙස හැඳින්වුණු සන්ධානය ඉතා ප්‍රබල එකමුතුවක් බවට පත්ව තිබුණි. එකම ප්‍රතිපත්ති මාලාවක් යටතේ සමගි පෙරමුණ නමින් නැවත මැතිවරණයකට ගොස් රටේ ජනතා වරමින් ප්‍රථම වතාවට මැති සබයේ තුනෙන් දෙකක බලයක් අත් පත් කරගෙන බලයට පත්වීමට සන්ධානයට හැකිවිය.

සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනියගේ නායකත්වයෙන් ආරම්භ වූ සමගි පෙරමුණු රජයට සමසමාජ නායක ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා මහතාට මුදල් ඇමති ධූරයත්, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මහතාට වැවිලි කර්මාන්ත අමාත්‍ය පදවියත් සමසමාජ ලේකම් ලෙස්ලි ගුණවර්ධන මහතාට ප්‍රවාහන ඇමැති ධූරයත් ලංකා කොමියුනිස්ට් පක්ෂයේ ලේකම් පීටර් කෙනමන් මහතාට නිවාස ඇමති ධූරයත් හිමිවීම මෙම සන්ධාන රජයේ විශේෂ ලක්ෂණයක් විය.




## හත් හවුලට එරෙහිව සමගි පෙරමුණ බිහිවීම

එසේ වුවත් 1975 අගෝස්තු 13 වැනිදා කොළඹ නගර ශාලාවේදී පැවැත්වූ හර්තාල් අනුස්මරණ රැස්වීමකදී ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා මහතා විසින් කරන ලදැයි කියන ප්‍රකාශයකින් තම මියගිය සැමියාට අවලාද නැඟුවේ යයි හටගත් ආරවුලක් දුරදිග යාම නිසා සමසමාජ පක්ෂයේ ඇමැතිවරුන් තිදෙනා සන්ධානයෙන් ඉවත්කර දැමීමට අගමැතිනිය කටයුතු කළාය.

මෙම වැරදි නිගමනය අවසාන් වූවේ රජය පවත්වාගෙන ගිය ශ්‍රී.ල.නි.පයට ආසන 08ක් පමණක් නොව මැතිසබය තුළ වසර 40ක් තරම් කාලයක් තුළ පැවති රතු නියෝජනය නැත්තටම නැතිවී යාමය.

හැත්තෑහතේ මැතිවරණය ආසන්නයේදී ඉතා වැදගත් සන්ධානයක් බිහිවූ බවද සැලකිල්ලට ගත යුතුවේ. ලංකාවේ දෙමළ භාෂාව කතා කරන සියලු පක්ෂ එකමුතු වී ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ නම් සන්ධානය පිහිටුවා ගැනීම එම සිද්ධියයි.

කලක් උතුරේ බලවත්ම පක්ෂය වූ ජී.ජී. පෙන්නම්බලම්ගේ නායකත්වයෙන් යුතු ලංකා ද්‍රවිඩ සංගමය විසින් බිඳී ගොඩනැගුණු දෙමළ ස්වරාජ්‍ය පක්ෂය හෙවත් ෆෙඩරල් පක්ෂය, වතුකරයේ වතු කම්කරු කොන්ග්‍රසය නියෝජනය කළ ඇස්. තොන්ඩමන්ගේ එම පක්ෂය මෙයට එක් වූ අනෙකුත් බලවේගයෝ වූහ.

කෙසේ වුවත් ජේ.ආර් ජයවර්ධන මහතාගේ නායකත්වයෙන් යුතු එක්සත් ජාතික පක්ෂයට ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ සහ වතු කම්කරු කොන්ග්‍රසය ද සහාය දුන් අතර ඉතා ඉක්මනින්ම තොන්ඩමන් ඇමැති මණ්ඩලයට එක්වූ අතර ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ආසන 08ක් පමණක් හිමිව තිබුණු සංදර්භයක් යටතේ ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණට විපක්ෂ නායක පදවිය ලබාදීමට ජේ.ආර්. ජයවර්ධන මහතා බලපෑම් කළ බවද නොරහසකි. ඔහු ජනාධිපතිවරයා වශයෙන් අවුරුදු 11ක් කටයුතු කළේය.

ජේ.ආර්. ගේ අනුප්‍රාප්තිකයා වූවේ ආර්. ප්‍රේමදාස මහතාය. 1982 ජනාධිපතිවරණයෙන් පසු ජනමත විචාරණයක් පවත්වා පවතින පාර්ලිමේන්තුවේ නිල කාලය දීර්ඝ කර ගැනීමට එක්සත් ජාතික පක්ෂය කටයුතු කළේය.

1977 දී බලයට පත්වූ පාර්ලිමේන්තුවේ මන්ත්‍රී සංයුතිය වෙනසකට ලක්වූවේ 1994 දීය. එය කළ හැකි වූවේ කැඩී බිඳී විසිරී තිබුණු විපක්ෂයේ බලවේග රාශියක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමග සමගි සන්ධානයක් ලෙස එක්ව කටයුතු කිරීම නිසාය.

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය වයෝවෘද්ධව සිටි නිසා එතුමියගේ දියණියක වන චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය නායකත්වය භාර ගැනීම නිසා නව ආකර්ෂණයක් ඇති විය.

ඇයගේ මෙහෙයවීම යටතේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, දේශවිමුක්ති ජනතා පක්ෂය, විජය කුමාරතුංග මහතා ගොඩනැගූ ශ්‍රී ලංකා මහජන පක්ෂය එක්සත්ව පොදුජන එක්සත් පෙරමුණ නම් වූ ප්‍රබල දේශපාලන සන්ධානය ගොඩනඟාගෙන 1994 මහා මැතිවරණයට මුහුණදීම නිසා යම් පමණක ජයග්‍රහණයක් ලබාගැනීමට හැකිවිය.

මෙයට තවත් වැදගත් දේශපාලන සිද්ධියක්ද බලපෑවේය. එක්සත් ජාතික පක්ෂයේ බලවත් බෙදීමක් ඇතිවීම එයට හේතුවිය. ආර්. ප්‍රේමදාස මහතා රාජ්‍ය පාලනයේදීත් පක්ෂය මෙහෙයවීමේදීත් තනි මතයට සහ හිතුවක්කාර අන්දමින් වැඩි දෙනා නොසලකා ක්‍රියා කරන බව ප්‍රකාශ කරමින් ලලිත් ඇතුළත් මුදලි සහ ගාමිණී දිසානායක යන බලවත් ඇමැතිවරුන් දෙදෙනා ජනාධිපති ආර්.ප්‍රේමදාසට විරුද්ධව 1991 දී දෝෂාභියෝගයක් ඉදිරිපත් කිරීම නිසා රටේ මහත් ආන්දෝලනයක් හට ගත්තේය. එහි අවසාන ප්‍රතිඵලය වශයෙන් "ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ"යනුවෙන් නව දේශපාලන පක්ෂයක් බිහි වූවේය.

එම පක්ෂය ද පොදු පෙරමුණට සහාය දීම නිසා බස්නාහිර දකුණු සහ වයඹ යන පළාත් සභා තුනේ බලය අත්පත් කර ගැනීමට මෙසේ සමගිව සන්ධානගතවූ පක්ෂ දෙකට හැකිවිය. 1994 මහා මැතිවරණයෙන් පසු ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසයේ සහායද පොදුජන එක්සත් පෙරමුණට හිමිවිය.

දෙවැනි වරටත් ජනාධිපතිවරණය සඳහා තරග කර බලය අත් පත් කර ගැනීමට චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය 2010.10.10 පැවැති මැතිවරණයේදී සමත් වූවාය. එහෙත් රජය තුළ පක්ෂ අතර මතභේද ඇති විය. එම නිසා රජය අර්බුදයකට ලක්වූවේය. මුස්ලිම් කොන්ග්‍රසය සහ රජයට සහාය දෙන වතු කම්කරු කොන්ග්‍රසය විරුද්ධ පක්ෂයට බැඳීම නිසා රජයට පාර්ලිමේන්තු බහුතර බලය නැතිව ගියේය.

එයට පිළියමක් වශයෙන් ජනතා විමුක්ති පෙරමුණ සමග සන්ධානයක් ගොඩනඟා ගැනීමට චන්ද්‍රිකා ජනාධිපතිනිය ඉදිරිපත් වූවාය. දීර්ඝ සාකච්ඡාවකින් පසුව 2001 සැප්තැම්බර් 15 වැනිදා ජනතා විමුක්ති පෙරමුණ සහ පොදුජන එක්සත් පෙරමුණ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

කව්රුන් කෙසේ විග්‍රහ කළද සන්ධාන ආණ්ඩුවල පැවැත්ම රඳා පවතින්නේ රජය තුළ තමන්ට ලැබෙන ඇමති තනතුරු සංඛ්‍යාව අනුව බව බොහෝ විට නිරීක්ෂණය වී ඇත. එනිසා ජනතා විමුක්ති පෙරමුණ තම කොන්දේසියක් වශයෙන් පරිවාස ආණ්ඩුව තුළ ඇමැති ධූර ගණන විස්සකට අඩු කළ යුතු යැයි ප්‍රකාශ කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සිටින සමහර ඇමැතිධූර අතහැරීමට සිදුවූ අතර තවත් පිරිසකට නියෝජ්‍ය ඇමැති ධූරවලට පත්වීමට සිදුවිය.

මෙම තත්ත්වය මත ජනාධිපතිනිය මහත් අපහසුතාවකට පත් වූවාය.-පරිවාස රජය වුවද යා දෙක- නොරත රත පන්නයේ වූවක් විය. පසුව ජනතා විමුක්ති පෙරමුණද අමාත්‍ය තනතුරු තුනක් භාරගත් බවද අපට මතකය. වර්තමාන ජ.වි.පෙ. නායක අනුර කුමාර දිසානායක මහතා කෘෂිකර්ම හා වාරිමාර්ග අමාත්‍යවරයා විය. ඒ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ උපතයි.

ඉදිරි මැතිවරණ ඉලක්ක කරගෙන ගොඩනැගෙතැයි අනුමාන කෙරෙන නොයෙකුත් සන්ධාන ගැන වුවද ජනතාව කියන්නේ "හවුලේ කැඳත් එපා" වැනි අරුත් දෙන කතාවකි. දැන් සිදුවන බොහෝ දේ අනුව අපට ද එසේ නොසිතෙන්නේ නොවේ.

**අවසාන කොටස ලබන සතියේ.**

**■ සෝමසිරි වික්‍රමසිංහ**